කඩිනම් ක්‍රියාපටිපාටිය පිළිබඳ තොරතුරු ඇමුණුම

CINGALESE - සිංහල භාෂාව

ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන **ඔබගේ ඉල්ලුම්පත්‍රය "කඩිනම්" ක්‍රියාපටිපාටියක්** හරහා විභාග කරනු ලැබේ. මෙයින් අදහස් කරන්නේ ඔබගේ ඉල්ලුම්පත්‍රය හැකි ඉක්මනින් විභාග කරනු ලබන අතර, එය විධිමත් **ලෙස ඉදිරිපත් කර මාස තුනක් ඇතුළත** ඒ පිළිබඳ තීරණයක් ගනු ලබන බවයි.

පහත සඳහන් අවස්ථාවන්ගෙන් එකකට අයත් වන බැවින් ඔබගේ ඉල්ලුම්පත්‍රය කඩිනම් ක්‍රියාපටිපාටිය යටතේ විභාග කරනු ඇත:

- ඔබ ඉල්ලුම්පත්‍රය විධිමත් ලෙස ඉදිරිපත් කළ අවස්ථාවේදී, ජාත්‍යන්තර ආරක්ෂාව ලබා දීමට කිසිදු අදාළත්වයක් නැති කරුණු මතු කර තිබීම;
- ඔබ පැහැදිලිවම අසම්බන්ධිත හෝ පරස්පර විරෝධී, පැහැදිලිවම අසත්‍ය හෝ පැහැදිලිවම සිදුවිය නොහැකි ප්‍රකාශ ලබා දී තිබීම, හෝ ඔබගේ මව් රට පිළිබඳ පවතින තොරතුරුවලට සම්පූර්ණයෙන්ම පටහැනි ප්‍රකාශ සිදු කර තිබීම;
- වලංගු හේතුවක් පෙන්වීමට අවස්ථාව තිබියදීත්, අසත්‍ය තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කරමින්, නැතහොත් විශේෂයෙන් ඔබගේ අනන්‍යතාවය සහ ජාතිකත්වයට අදාළ වැදගත් තොරතුරු හිතාමතාම සඟවමින්, හෝ වංචනික චේතනාවෙන් වැදගත් ලේඛන හිතාමතාම විනාශ කර හෝ අතුරුදහන් කරමින් බලධාරීන් මුළා කිරීම;
- ඉතාලි භූමියෙන් ඔබව පිටුවහල් කිරීමට ගත් තීරණයක් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම, බාධා කිරීම හෝ වැළැක්වීමේ තනි අරමුණින් පමණක් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කර තිබීම;
- ඔබ පැමිණි රට ඉතාලිය හෝ යුරෝපා සංගමය විසින් ආරක්ෂිත මව් රටක් ලෙස සලකනු ලබන රටක් වීම;
- ඔබ ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමයට තර්ජනයක් යැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබීම, හෝ ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය සම්බන්ධ බරපතළ හේතු මත ඔබව දැනටමත් රටින් පිටුවහල් කර තිබීම;
- ඔබ පිළිගත හැකි යැයි සැලකෙන නැවත නැවතත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර තිබීම;
- ඔබ නීතිවිරෝධී ලෙස ඉතාලියට ඇතුළු වී හෝ ඔබගේ රැඳී සිටීමේ කාලය නීතිවිරෝධී ලෙස දීර්ඝ කර තිබීම සහ කිසිදු වලංගු හේතුවක් නොමැතිව, නියමිත වේලාවට අදාළ බලධාරීන් වෙත පෙනී නොසිටීම හෝ හැකි ඉක්මනින් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් නොකිරීම;
- ඔබ නීත්‍යානුකූලව ඉතාලියට ඇතුළු වී, කිසිදු වලංගු හේතුවක් නොමැතිව හැකි ඉක්මනින් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් නොකිරීම; ඔබ දැනටමත් ඔබගේ මව් රටෙන් බැහැරව සිටින විට ඇතිවන ජාත්‍යන්තර ආරක්ෂාවක අවශ්‍යතාවයක් (“*sur place*”) ඇති අවස්ථාවලදී මෙය අදාළ නොවේ;

- මුළු යුරෝපා සංගමය සඳහාම වන නවතම වාර්ෂික යුරෝස්ටැට් (Eurostat) සාමාන්‍ය දත්තවලට අනුව, ඔබ පැමිණි රටේ ජාත්‍යන්තර ආරක්ෂාව පිළිගැනීමේ ප්‍රතිශතය 20%ක් හෝ ඊට අඩු වීම; ඔබගේ මව් රටේ සැලකිය යුතු වෙනසක් සිදුවී ඇත්නම් හෝ ඔබ විශේෂ ආරක්ෂණ අවශ්‍යතා සහිත පුද්ගල ගණයකට අයත් වේ නම්, සහ පළමු අදියරේ තීරණ සහ අවසන් තීරණ අතර පවතින සැලකිය යුතු වෙනස්කම් ද සැලකිල්ලට ගනිමින් මෙය අදාළ නොවිය හැක.

ඔබගේ ඉල්ලුම්පත්‍රය කඩිනම් ක්‍රියාපටිපාටිය හරහා විභාග කළද, **ප්‍රාදේශීය කොමිසම විසින් ඔබගේ සියලුම ආරක්ෂණ අවශ්‍යතා පිළිබඳව සැමවිටම සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වනු ඇත.** ඔබගේ ඉල්ලුම්පත්‍රය විභාග කිරීම සංකීර්ණ සහ වැඩි කාලයක් ගතවන බව කොමිසම සලකන්නේ නම්, ක්‍රියාපටිපාටිය වෙනස් කර සාමාන්‍ය ක්‍රියාපටිපාටිය (procedura ordinaria) යටතේ ඔබගේ ඉල්ලුම්පත්‍රය දිගටම විභාග කළ හැකිය. ඒ සඳහා තීරණයක් ගැනීමට වැඩි කාලයක් ගතවේ (විධිමත් කළ දින සිට මාස හයක්, හැකි දීර්ඝ කිරීම් ද සහිතව).

ඔබට විශේෂිත ක්‍රියාපටිපාටි අවශ්‍යතා තිබේ නම්, ප්‍රාදේශීය කොමිසම ඔබගේ ඉල්ලුම්පත්‍රය විභාග කරන කාලය තුළ ඔබට අවශ්‍ය නිසි සහය ලබා දෙනු ඇත.

විශේෂයෙන්ම, ඔබ අවදානමට ලක්විය හැකි පුද්ගල ගණයකට අයත් වන්නේ නම් මෙය සිදුවිය හැකිය. එනම් ඔබට **ශාරීරික හෝ මානසික සෞඛ්‍ය ගැටලු තිබීම**, ස්වාධීනව ඇතැම් කටයුතු කිරීමට බාධා **පවතින** සහ/හෝ **ආබාධිත** තැනැත්තෙකු වීම, **වධහිංසාවලට** හෝ **බරපතළ මානසික**, ශාරීරික, ලිංගික හෝ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයකට ලක්ව තිබීම මීට ඇතුළත් වේ. මෙම අවස්ථාවන්හිදී, කඩිනම් ක්‍රියාපටිපාටිය තුළදී ඔබට අවශ්‍ය සහය ලබා දිය නොහැකි බව ප්‍රාදේශීය කොමිසම සලකන්නේ නම්, ඔබගේ **නඩුව සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ** විභාග කිරීමට එය තීරණය කළ හැකිය.

එබැවින්, ඔබ ඉහත සඳහන් ප්‍රවර්ගවලින් එකකට අයත් වන්නේ නම්, **ඔබගේ ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කරන මහජන ආරක්ෂක බලධාරියාට ඔබගේ විශේෂ අවශ්‍යතා පිළිබඳව දැනුම් දීම** මෙන්ම, ඉල්ලුම්පත්‍රය විධිමත් කිරීමේ **මාර්ගගත (online)** පෝරමයේ ඔබගේ අවදානම් සහ/හෝ විශේෂ **අවශ්‍යතා සඳහන් කිරීම සහ එම විශේෂ අවශ්‍යතාවලට අදාළව** ඔබ සතු විය හැකි ඕනෑම ලේඛනයක් **ඇමිණීම වැදගත් වේ**. මෙම අවස්ථාවන්හිදී, ප්‍රාදේශීය කොමිසම ඔබගේ නඩුව සඳහා සාමාන්‍ය විභාග ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමට තීරණය කළ හැකි අතර, අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය පිළිබඳව ඔබට දැනුම් දෙනු ඇත.

ප්‍රාදේශීය කොමිසම විසින් ඔබගේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් සහ එම ප්‍රතික්ෂේප කිරීමේ තීරණය වැරදි බව ඔබ සලකන්නේ නම්, සිවිල් අධිකරණයට (Tribunale civile) අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔබට අයිතියක් ඇත.

අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා නීතිඥයෙකුගේ සහාය අවශ්‍ය වන අතර, රජයේ වියදමින් නොමිලේ නීති සහාය (නීති උපකාර) ලබා ගැනීමේ හැකියාව ඇත. අභියාචනයක් ඉදිරිපත් කිරීමේ කොන්දේසි මෙම ඇමුණුම සමඟ ඔබට ලබා දී ඇති සාමාන්‍ය විභාග ක්‍රියාපටිපාටිය පිළිබඳ අත්පත්‍රිකාවේ විස්තර කර ඇත.

කෙසේ වෙතත්, ඔබගේ නඩුව සඳහා කඩිනම් ක්‍රියාපටිපාටිය අන්වර්ථ කර ඇත්නම්, ප්‍රාදේශීය කොමිසමේ තීරණය ඔබට ලැබුණු දින සිට **දින 7ක් ඇතුළත** ඔබ අභියාචනය ඉදිරිපත් කළ යුතුය.

එමෙන්ම, අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ඔබට ඉතාලියේ රැඳී සිටීමේ අයිතිය සහතික නොවේ. විනිසුරුවරයා ඉදිරියේ නඩු කටයුතු සිදුවන කාලය තුළ ඔබට ඉතාලියේ රැඳී සිටීමට අවශ්‍ය නම්, ඔබගේ අභියාචනය මඟින් ඉතාලියේ රැඳී සිටීමට පැහැදිලිවම අවසර ඉල්ලා සිටිය යුතුය.

නඩු කටයුතු පවතින කාලය තුළ ඔබට ඉතාලියේ රැඳී සිටීමට අයිතියක් තිබේද යන්න විනිසුරුවරයා **දින 10ක් ඇතුළත** තීරණය කරනු ඇත. තවද, විනිසුරුවරයා **මාස 4ක් ඇතුළත** ඔබගේ ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ඇත.

ක්‍රියාපටිපාටිය පිළිබඳ අනෙකුත් සියලුම තොරතුරු සඳහා, මෙම ඇමුණුම සමඟ ඔබට ලබා දී ඇති සාමාන්‍ය ක්‍රියාපටිපාටියට අදාළ අත්පත්‍රිකාව පරිශීලනය කළ හැකිය.